# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 393/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 06/03/2024 පැය 1030

## මාධ්‍ය නිවේදනය

**වෙළඳ නාමය ව්‍යාජ ලෙස භාවිතා කළ සැකකරුවෙකු අත්අඩංගුවට-කුලියාපිටිය විශේෂ අපරාධ විමර්ශන ඒකකය.**

නාරම්මල ප්‍රදේශයේ නිමි ඇඳුම් අළෙවිසැලක ව්‍යාජ ලෙස යූ.එස්.පෝලෝ නැමති වෙළඳ නාමය යොදාගනිමින් නිෂ්පාදනය කරන ලද නිමි ඇඳුම් අලෙවි කරන බවට 2024.02.28 වන දින කුලියාපිටිය විශේෂ අපරාධ විමර්ශන අංශය වෙත ලද පැමිණිල්ලකට අනුව විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

විමර්ශන නිලධාරින් විසින් මෙම පැමිණිල්ල සම්බන්ධව බුද්ධිමය දේපල පනත යටතේ නාරම්මල ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර එම වෙළඳසැල පරික්ෂා කිරීම සඳහා සහ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා සෝදිසි වරෙන්තුවක් ලබාගෙන ඇත. ඒ අනුව 2023.03.05 වන දින කුලියාපිටිය විශේෂ අපරාධ විමර්ශන අංශයේ නිලධාරින් කණ්ඩායමක් එම වෙළඳසැල පරීක්ෂා කිරීමට ලක් කිරීමේදී ඉහත වෙළඳ නාමය සහ සලකුණ යොදාගනිමින් නිෂ්පාදිත ටී ෂර්ට් 248 ක් හා ඩෙනිම් කලිසම් 08 ක් සමඟ එම වෙළඳසැලේ සිටි ව්‍යාපාරිකයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන නාරම්මල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කුලියාපිටිය විශේෂ අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. මෙම ආකාරයට අන්සතු වෙළඳ නාමයන් භාවිතා කරමින් නිෂ්පාදන සිදු කිරීම හා අළෙවි කිරීම බුද්ධිමය දේපළ පනත යටතේ වරදක් වන බැවින් එවැනි සිදු වීම් පිළබඳව පැමිණිලි තිබේනම් ළඟම පොලිස් ස්ථානයට පැමිණිලි කල හැකිය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**